# නිවන් මග උදෙසා දශර්න ඥාණය

**සංයුත්ත නිකාය >සළායතන වගර්ය >සළායතන සංයුත්තං >ලෝකකාමගුණ වගර්ය**

ලෝකන්තගමන සුත්තං

**නාහං භික්ඛවේ ගමනේන ලෝකස්ස අන්තං ඤාතෙයාං දට්ඨෙයාං පත්තෙයාන්ති වදාමි. න ච පනාහං භික්ඛවේ අප්පත්වා ලෝකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදාමීති. ඉදං වත්වා භගවා උට්ඨායාසනා විහාරං පාවිසි.**

පින්වත් මහණෙනි, ගමනින් ගිහින් ලෝකයෙහි කෙළවරක් දැන ගන්න පුළුවන් ය කියලා, දැකගන්ට පුළුවන් ය කියලා, පැමිණෙන්ට පුළුවන් ය කියලා මා කියන්නේ නෑ. නමුත් පින්වත් මහණෙනි, ලෝකයෙහි කෙළවරට පැමිණෙන්නේ නැතුව දුක කෙළවර කිරීමක් ගැනත් මා කියන්නේ නෑ කියලා භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා අසුනෙන් නැගිට විහාරයට වැඩම කළා.

……………………………………………………

**යේන ඛෝ ආවුසෝ ලෝකස්මිං ලෝකසඤ්ඤී හෝති ලෝකමානී, අයං වුච්චති අරියස්ස විනයේ ලෝකෝ. කේන චාවුසෝ ලෝකස්මිං ලෝකසඤ්ඤී හෝති ලෝකමානී?**

ප්‍රිය ආයුෂ්මතුනි, යමක් නිසාවෙන් ලෝකයෙහි ලෝකය ය යන සංඥාව ඇතිවෙයි ද, ලෝකය ය යන මිම්ම ඇතිවෙයි ද, ආයර් විනයෙහි ලෝකය කියන්නේ මෙයට තමයි. ප්‍රිය ආයුෂ්මතුනි, කුමක් හේතුවෙන් ද ලෝකයෙහි ලෝකය හඳුනාගන්නේ, ලෝකය යන මිම්ම ඇති වෙන්නේ?

**චක්ඛුනා ඛෝ ආවුසෝ ලෝකස්මිං ලෝකසඤ්ඤී හෝති ලෝකමානී. සෝතේන ඛෝ ආවුසෝ ලෝකස්මිං ලෝකසඤ්ඤී හෝති ලෝකමානී, ඝානේන ඛෝ ආවුසෝ ලෝකස්මිං ලෝකසඤ්ඤී හෝති ලෝකමානී, ජිව්හාය ඛෝ ආවුසෝ ලෝකස්මිං ලෝකසඤ්ඤී හෝති ලෝකමානී. කායේන ඛෝ ආවුසෝ ලෝකස්මිං ලෝකසඤ්ඤී හෝති ලෝකමානී. මනේන ඛෝ ආවුසෝ ලෝකස්මිං ලෝකසඤ්ඤී හෝති ලෝකමානී. යේන ඛෝ ආවුසෝ ලෝකස්මිං ලෝකසඤ්ඤී හෝති ලෝකමානී. අයං වුච්චති අරියස්ස විනයේ ලෝකෝ.**

ප්‍රිය ආයුෂ්මතුනි, ඇස නිසාවෙනුයි ලෝකයෙහි ලෝකසංඥාව ඇතිවන්නේ. ලෝකය ය යන මිම්ම ඇති වෙන්නේ. කන නිසාවෙනුයි ලෝකයෙහි ලෝකසංඥාව ඇතිවන්නේ. ලෝකය ය යන මිම්ම ඇති වෙන්නේ. නාසය නිසාවෙනුයි ලෝකයෙහි ලෝකසංඥාව ඇතිවන්නේ. ලෝකය ය යන මිම්ම ඇති වෙන්නේ. දිව නිසාවෙනුයි ලෝකයෙහි ලෝකසංඥාව ඇතිවන්නේ. ලෝකය ය යන මිම්ම ඇති වෙන්නේ. කය නිසාවෙනුයි ලෝකයෙහි ලෝකසංඥාව ඇතිවන්නේ. ලෝකය ය යන මිම්ම ඇති වෙන්නේ. මනස නිසාවෙනුයි ලෝකයෙහි ලෝකසංඥාව ඇතිවන්නේ. ලෝකය ය යන මිම්ම ඇති වෙන්නේ. ප්‍රිය ආයුෂ්මතුනි, යමක් නිසාවෙන් ලෝකයෙහි ලෝකය ය යන සංඥාව ඇතිවෙයි ද, ලෝකය ය යන මිම්ම ඇතිවෙයි ද, ආයර් විනයෙහි ලෝකය කියන්නේ මෙයට තමයි.

සංයුත්ත නිකාය >සගාථ වගර්ය >දේවපුත්ත සංයුත්තං >නානාතිත්ථිය වගර්ය

රෝහිතස්ස සුත්තං

සාවත්ථියං....

සැවැත් නුවර ජේතවනාරාමයේදී ………………………

**ඒකමන්තං ඨිතෝ ඛෝ රෝහිතස්සෝ දේවපුත්තෝ භගවන්තං ඒතදවෝච. යත්ථ නු ඛෝ භන්තේ, න ජායති න ජීයති න මීයති න චවති න උප්පජ්ජති සක්කා නු ඛෝ සෝ භන්තේ ගමනේන ලෝකස්ස අන්තෝ ඤාතුං වා දට්ඨුං වා පාපුණිතුං වාති.**

එකත්පසක සිටි රෝහිතස්ස දිව්‍ය පුත්‍රයා භාග්‍යවතුන් වහන්සේට මෙහෙම කිව්වා.“ස්වාමීනි, යම් තැනක උපදින්නෙ නැත්නම්, දිරන්නෙ නැත්නම්, මැරෙන්නෙ නැත්නම්, චුත වෙන්නෙ නැත්නම්, යළි උපදින්නෙ නැත්නම්, ස්වාමීනි, ලෝකයේ කෙළවර වූ එතනට පයින් යන්න පුළුවන්ද?”

**යත්ථ ඛෝ ආවුසෝ න ජායති න ජීයති න මීයති න චවති න උප්පජ්ජති නාහං තං ගමනේන ලෝකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමීති.**

“ආයුෂ්මතුනි, යම් තැනක උපදින්නෙ නැත්නම්, දිරන්නෙ නැත්නම්, මැරෙන්නෙ නැත්නම්, චුත වෙන්නෙ නැත්නම්, යළි උපදින්නෙ නැත්නම්, ඒ ලෝකයේ කෙළවරට පා ගමනින් ගිහින් දැනගන්න, දැකගන්න පුළුවන් කියලා මං කියන්නෙ නෑ.”

**අච්ඡරියං භන්තේ, අබ්භුතං භන්තේ යාවසුභාසිතමිදං භන්තේ භගවතා. යත්ථ ඛෝ ආවුසෝ න ජායති න ජීයති න මීයති න චවති න උප්පජ්ජති නාහං තං ගමනේන ලෝකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමීති.**

“ස්වාමීනි, ආශ්චර්යයි! ස්වාමීනි, අද්භූතයි! ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වදාළේ කොයිතරම් ඇත්තක්ද, ‘ආයුෂ්මතුනි, යම් තැනක උපදින්නෙ නැත්නම්, දිරන්නෙ නැත්නම්, මැරෙන්නෙ නැත්නම්, යළි උපදින්නෙ නැත්නම්, ඒ ලෝකයේ කෙළවරට පා ගමනින් ගිහින් දකින්න පුළුවන් කියලා, දැනගන්න පුළුවන් කියලා, පැමිණෙන්න පුළුවන් කියලා මම කියන්නෙ නැහැ’ කියලා වදාළේ.

**භූතපුබ්බාහං භන්තේ, රෝහිතස්සෝ නාම ඉසි අහෝසිං භෝජපුත්තෝ ඉද්ධිමා වේහාසංගමෝ. තස්ස මය්හං භන්තේ ඒවරූපෝ ජවෝ අහෝසි. සෙය්‍යථාපි නාම දළ්හධම්මා ධනුග්ගහෝ සික්ඛිතෝ කතහත්ථෝ කතයොග්ගෝ කතූපාසනෝ ලහුකේන අසනේන අප්පකසිරේනේව තිරියං තාලච්ඡායං අතිපාතෙය්‍ය.**

ස්වාමීනි, මේක ඉස්සර වෙච්ච දෙයක්. මං භෝජ පුත්‍ර වූ රෝහිතස්ස කියන නමිනුත්, ඉර්ධිමත්, අහසින් යන්න පුළුවන් ඉසිවරයෙක් වෙලා හිටියා. ස්වාමීනි, ඒ කාලෙ මට මෙන්න මේ විදිහේ ශක්තියක් තිබුනා. හොඳට පුහුණු වුන, හොඳට පුරුදු වුන, තරහ කරල ජයගත්තු, ශිල්ප දැක්වූ, අතිශයින්ම දක්ෂ දුනුවායෙක් සැහැල්ලු ඊතලයකින් වේලිච්ච තල් කොළයක් පලාගෙන යන විදිහට විදිනවා වගේ, මටත් අන්න ඒ වගේම ශක්තියක් තිබුනා.

**තස්ස මය්හං භන්තේ, ඒවරූපෝ පදවීතිහාරෝ අහෝසි. සෙය්‍යථාපි පුරත්ථිමා සමුද්දා පච්ඡිමෝ සමුද්දෝ. තස්ස මය්හං භන්තේ ඒවරූපං ඉච්ඡාගතං උප්පජ්ජි. අහං ගමනේන ලෝකස්ස අන්තං පාපුණිස්සාමීති.**

එතකොට ස්වාමීනි, මට පුළුවන්කම තිබුනා නැගෙනහිර මුහුදට එක පයක් තියලා, අනිත් පය බටහිර මුහුදට තියන තරමේ දුරට පා තබා යන්න. ඉතින් ස්වාමීනි, ඒ මට මෙන්න මේ විදිහේ ආශාවක් ඇතිවුනා, 'ඇත්තටම මම පා ගමනින්ම ලෝකයේ කෙළවරකට එන්න ඕන' කියලා.

**සො'හං භන්තෙ ඒවරූපේන ජවේන සමන්නාගතො ඒවරූපේන ච පදවීතිහාරේන අඤ්ඤත්‍රේව අසිතපීතඛායිතසායිතා අඤ්ඤත්‍ර උච්චාරපස්සාවකම්මා අඤ්ඤත්‍ර නිද්දාකිලමථපටිවිනෝදනා වස්සසතායුකෝ වස්සසතජීවී වස්සසතං ගන්ත්වා අප්පත්වාව ලෝකස්ස අන්තං අන්තරාව කාලකතො.**

ස්වාමීනි, මේ තරම් වේගයක් තිබුණු, මේ තරම් වේගයෙන් ගමන් කරන්න පුළුවන්කමක් තිබුණු මම, අවුරුදු සියයක් ජීවත් වෙමින්, කනබොන වෙලාව හැර, වැසිකිළි කැසිකිළි කරන වෙලාව හැර, නිදියන, මහන්සි අරින වෙලාව හැර, අවුරුදු සීයක්ම ඇවිදලත්, ලෝකයේ කෙළවරකට එන්න බැරුව අතරමගදීම මිය පරලොව ගියා.

**අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යාවසුභාසිතමිදං භන්තෙ භගවතා. යත්ථ බෝ ආවුසෝ න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජති නාහං තං ගමනේන ලෝකස්ස අන්තං ඤාතෙය්‍යං දට්ඨෙය්‍යං පත්තෙය්‍යන්ති වදාමීති.**

ස්වාමීනි, ආශ්චර්යයි! ස්වාමීනි, අද්භූතයි! ස්වාමීනි, ඔබවහන්සේ විසින් යමක් පවසා වදාළ නම්, 'ආයුෂ්මතුනි, යම් තැනක උපදින්නෙ නැත්නම්, මැරන්නෙ නැත්නම්, මිය යන්නෙ නැත්නම්, චුත වෙන්නෙ නැත්නම්, යළි ඉපදීමක් නැත්නම්, අන්න ඒ ලෝකයෙ කෙළවර පා ගමනින් ගිහිල්ල දැනගන්න පුළුවන් බව, දැකගන්න පුළුවන් බව, පැමිණෙන්න පුළුවන් බව මම කියන්නෙ නැහැ' කියලා. ඒ කාරණය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ එක කොයිතරම් ඇත්තක්ද?"(භාග්‍යවතුන් වහන්සේ) :

**න බෝ පනාහං ආවුසෝ, අප්පත්වා ලෝකස්ස අන්තං දුක්ඛස්ස අන්තකිරියං වදාමි. අපි චාහං ආවුසෝ ඉමස්මිඤ්ඤේව බ්‍යාමමත්තේ කලේබරේ සසඤ්ඤිම්හි සමනකේ ලෝකඤ්ච පඤ්ඤාපේමි, ලෝකසමුදයඤ්ච ලෝකනිරෝධඤ්ච ලෝකනිරෝධගාමිනිඤ්ච පටිපදන්ති.**

"ආයුෂ්මතුනි, එසේ වුනත් ලෝකයේ කෙළවරකට එන්නෙ නැතුව, මේ දුක කෙළවර කරන්න පුළුවන් කියල මම කියන්නෙ නෑ. එහෙම වුනත් ආයුෂ්මතුනි, මේ සඤ්ඤා සහිත සිත සහිත වූ බඹයක් විතර ප්‍රමාණයේ වූ මේ ශරීරයේම තමයි ලෝකයත්, ලෝකයේ හටගැනීමත්, ලෝකයේ නිරුද්ධ වීමත්, ලෝකය නිරුද්ධ වීමේ ප්‍රතිපදාවත් තියෙන්නෙ කියලයි මම කියන්නෙ.

**ගමනේන න පත්තබ්බෝ ලෝකස්සන්තෝ කුදාචනං**

**න ච අප්පත්වා ලෝකන්තං දුක්ඛා අත්ථි පමෝචනං**

කවදාවත් පයින් ගිහිල්ලා නම් මේ ලෝකයේ කෙළවරකට යන්න බෑ. (හැබැයි) ලෝකෙ කෙළවරකට එන්නෙ නැතුව, දුකින් නිදහස් වීමකුත් නෑ.

**තස්මා හවේ ලෝකවිදූ සුමේධෝ ලෝකන්තගූ වුසිතබ්‍රහ්මචරියෝ**

**ලෝකස්ස අන්තං සමිතාවි ඤත්වා නාසිංසති ලෝකමිමං පරඤ්චාති**

ඒ නිසා, ලෝකය දන්න, ප්‍රඥාවන්ත වූ, ලෝකයේ කෙළවරට ගිය, බ්‍රහ්මචාරී ජීවිතය සම්පූර්ණ කළ, පාපය සිඳබිඳ දැම්ම ඒ උතුම් පුද්ගලයා, ලෝකයේ කෙළවර දැනගෙන, මෙලොවත්, පරලොවත් පතන්නෙ නෑ.

සාදු! සාදු!! සාදු!!!

සංයුත්ත නිකාය >සළායතන වග්ගය >සළායතන සංයුත්තං >ගිලාන වග්ගය

ලෝක සුත්තං

**අථ ඛෝ අඤ්ඤතරෝ භික්ඛු යේන භගවා තේනුපසංකමි ....(පෙ).... ඒකමන්තං නිසින්නෝ ඛෝ සෝ භික්ඛු භගවන්තං ඒතදවෝච, ලෝකෝ ලෝකෝති භන්තේ වුච්චති. කිත්තාවතා නු ඛෝ භන්තේ, ලෝකෝති වුච්චතීති.**

එදා එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි තැනට පැමිණුනා ....(පෙ).... එකත්පස්ව වාඩිවුණ ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේගෙන් මෙකරුණ විමසුවා. ස්වාමීනී, ලෝකය, ලෝකය කියලා කියනවා. ස්වාමීනී, ලෝකය කියලා කියන්නේ කවර කරුණු මත ද?

**ලුජ්ජතීති ඛෝ භික්ඛු තස්මා ලෝකෝති වුච්චති. කිඤ්ච ලුජ්ජති? චක්ඛුං ඛෝ භික්ඛු ලුජ්ජති. රූපා ලුජ්ජන්ති, චක්ඛුවිඤ්ඤාණං ලුජ්ජති, චක්ඛුසම්ඵස්සෝ ලුජ්ජති, යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වේදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ලුජ්ජති ....(පෙ).... ලුජ්ජතීති ඛෝ භික්ඛු තස්මා ලෝකෝති වුච්චතීති.**

පින්වත් භික්ෂුව, "සිඳී බිඳී යයි" යන අරුතෙන් තමයි ලෝකය කියලා කියන්නේ. කුමක්ද සිඳී බිඳී යන්නේ? පින්වත් භික්ෂුව, ඇස යි සිඳී බිඳී යන්නේ. රූප යි සිඳී බිඳී යන්නේ. ඇසේ විඤ්ඤාණය යි සිඳී බිඳී යන්නේ. ඇසේ ස්පර්ශය යි සිඳී බිඳී යන්නේ. ඇසේ ස්පර්ශයෙන් උපදින්නා වූ සැප වේවා, දුක් වේවා, දුක්සැප රහිත වේවා යම් විඳීමක් ඇද්ද එය යි සිඳී බිඳී යන්නේ ....(පෙ).... පින්වත් භික්ෂුව, "සිඳී බිඳී යයි" යන අරුතෙන් තමයි ලෝකය

සංයුත්ත නිකාය >ඛන්ධක වග්ගය >රාධ සංයුත්තං >පඨම මාර වග්ගය

සත්ත සුත්තං

161. සැවැත් නුවර දී ...........................

**ඒකමන්තං නිසින්නෝ ඛෝ ආයස්මා රාධෝ භගවන්තං ඒතදවෝච. සත්තෝ සත්තෝති, භන්තේ, වුච්චති. කිත්තාවතා නු ඛෝ භන්තේ, සත්තෝති වුච්චති?**

එකත්පස්ව වාඩිවුණ ආයුෂ්මත් රාධයන් භාග්‍යවතුන් වහන්සේගෙන් මෙකරුණ විමසුවා. "ස්වාමීනි, 'සත්වයා, සත්වයා' යැයි කියනවා. ස්වාමීනි, කුමන කරුණු මතද සත්වයායි කියන්නේ?"

**රූපෙ ඛො රාධ, යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා, තත්‍ර සත්තො තත්‍ර විසත්තො තස්මා සත්තොති වුච්චති. වේදනාය යො ඡන්දො යො රාගො ....(පෙ).... සඤ්ඤාය ....(පෙ).... සංඛාරේසු ....(පෙ).... විඤ්ඤාණෙ යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා, තත්‍ර සත්තො තත්‍ර විසත්තො තස්මා සත්තොති වුච්චති.**

“පින්වත් රාධ, රූපය පිළිබඳව යම් කැමැත්තක් තියෙනවා නම්, යම් රාගයක් තියෙනවා නම්, යම් සතුටින් පිළිගැනීමක් තියෙනවා නම්, යම් තණ්හාවක් තියෙනවා නම් ඒ රූපයෙහි ඇලී සිටිනවා නම්, ඒ රූපයෙහි දැඩි ලෙස ඇලී සිටිනවා නම් අන්න ඒ නිසා තමයි ‘සත්වයා’ කියන්නේ. විඳීම පිළිබඳව යම් කැමැත්තක් තියෙනවා නම්, යම් රාගයක් තියෙනවා නම් .... (පෙ) .... සඤ්ඤාව පිළිබඳව .... (පෙ) .... සංස්කාර පිළිබඳව .... (පෙ) .... විඤ්ඤාණය පිළිබඳව යම් කැමැත්තක් තියෙනවා නම්, යම් රාගයක් තියෙනවා නම්, යම් සතුටින් පිළිගැනීමක් තියෙනවා නම්, යම් තණ්හාවක් තියෙනවා නම් ඒ විඤ්ඤාණයෙහි ඇලී සිටිනවා නම්, ඒ විඤ්ඤාණයෙහි දැඩි ලෙස ඇලී සිටිනවා නම් අන්න ඒ නිසා තමයි ‘සත්වයා’ කියන්නේ.

**සෙය්‍යථාපි රාධ, කුමාරකා වා කුමාරිකායො වා පංසවාගාරකේහි කීළන්ති, යාවකීවඤ්ච තේසු පංසවාගාරකේසු අවිගතරාගා හොන්ති අවිගතච්ඡන්දා අවිගතපේමා අවිගතපිපාසා අවිගතපරිළාහා අවිගතතණ්හා, තාව තානි පංසවාගාරකානි අල්ලීයන්ති කේළායන්ති ධනායන්ති මමායන්ති.**

පින්වත් රාධ, එය මෙවැනි දෙයක්. කුඩා දරුවන් හෝ කුඩා දැරියන් ඉන්නවා. ඔවුන් වැලිගෙවල්වලින් සෙල්ලම් කරනවා. යම්තාක්කල් වැලි ගෙවල් කෙරෙහි ඇති ඔවුන්ගේ රාගය දුරුවෙලා නැත්නම්, ඔවුන්ගේ කැමැත්ත දුරුවෙලා නැත්නම්, ඔවුන්ගේ ප්‍රේමය දුරුවෙලා නැත්නම්, ඔවුන්ගේ පිපාසය දුරුවෙලා නැත්නම්, ඔවුන්ගේ දැවිල්ල දුරුවෙලා නැත්නම්, ඔවුන්ගේ තණ්හාව දුරුවෙලා නැත්නම්, ඒතාක්කල් ම ඔවුන් ඒ වැලිගෙවල්වලට ආශා කරනවා. ලොල් වෙනවා. තමන්ගේ වස්තුවක් හැටියට සළකනවා. මගේ ය කියලා අයිතිය කියනවා.

**යතො ච ඛො රාධ, කුමාරකා වා කුමාරිකායො වා තේසු පංසවාගාරකේසු විගතරාගා හොන්ති විගතඡන්දා විගතපේමා විගතපිපාසා විගතපරිළාහා විගතතණ්හා, අථ ඛො තානි පංසවාගාරකානි හත්ථේහි ච පාදේහි ච විකිරන්ති විධමන්ති විද්ධංසෙන්ති විකීළනිකං කරොන්ති.**

නමුත් පින්වත් රාධයෙනි, යම් කලෙක ඒ කුඩා දරුවන් වේවා, ඒ කුඩා දියණිවරුන් වේවා ඒ වැලිගෙවල් කෙරෙහි ඔවුන් තුළ තිබුණ රාගය දුරුවුණා නම්, කැමැත්ත දුරුවුණා නම්, ප්‍රේමය දුරුවුණා නම්, පිපාසය දුරුවුණා නම්, දැවිල්ල දුරුවුණා නම්, තණ්හාව දුරුවුණා නම් එතකොට ඔවුන් අත්වලිනුත්, පාවලිනුත් ඒ වැලි ගෙවල් විසුරුවලා දානවා. බිඳලා දානවා. සුනුවිසුණු කරනවා. ආයෙමත් සෙල්ලම් කරන්න බැරි විදිහට පත්කරනවා.

**ඒවමේව ඛො රාධ, තුම්හේපි රූපං විකිරථ විධමථ විද්ධංසේථ, විකීළනිකං කරෝථ. තණ්හක්ඛයාය පටිපජ්ජථ. වේදනං විකිරථ ....(පෙ).... සඤ්ඤං විකිරථ ....(පෙ).... සංඛාරේ විකිරථ ....(පෙ).... විඤ්ඤාණං විකිරථ විධමථ විද්ධංසේථ, විකීළනිකං කරෝථ. තණ්හක්ඛයාය පටිපජ්ජථ. තණ්හක්ඛයො හි රාධ, නිබ්බානන්ති.**

පින්වත් රාධයෙනි, ඔන්න ඔය විදිහට ම ඔබත් රූපය විසුරුවලා දාන්න. බිඳලා දාන්න. සුනුවිසුණු කරන්න. ආයෙමත් සෙල්ලම් කරන්න බැරි විදිහට පත්කරන්න. තණ්හාව ක්ෂය වීම පිණිස පිළිපදින්න. විඳීම විසුරුවලා දාන්න .... (පෙ) .... සඤ්ඤාව විසුරුවලා දාන්න .... (පෙ) .... සංස්කාර විසුරුවලා දාන්න .... (පෙ) .... විඤ්ඤාණය විසුරුවලා දාන්න. බිඳලා දාන්න. සුනුවිසුණු කරන්න. ආයෙමත් සෙල්ලම් කරන්න බැරි විදිහට පත්කරන්න. තණ්හාව ක්ෂය වීම පිණිස පිළිපදින්න. පින්වත් රාධ, තණ්හාය ක්ෂය වීම ම යි ඒ අමා නිවන් කියන්නේ.”

## සමිද්ධි - මාරපඤ්හ සුත්තං

**ඒකං සමයං භගවා රාජගහේ විහරති වේළුවනේ කලන්දක නිවාපේ. අථ ඛෝ ආයස්මා සමිද්ධි යේන භගවා තේනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං නිසීදි. ඒකමන්තං නිසින්නෝ ඛෝ ආයස්මා සමිද්ධි භගවන්තං ඒතදවෝච: මාරෝ, මාරෝති භන්තේ, වුච්චති. කිත්තාවතා නු ඛෝ භන්තේ මාරෝ වා අස්ස මාරපඤ්ඤත්ති වාති?**

ඒ දිනවල භාග්‍යවතුන් වහන්සේ වැඩසිටියේ රජගහ නුවර කලන්දක නිවාප නම් වූ වේළුවනාරාමයේ. එදා ආයුෂ්මත් සමිද්ධි තෙරුන් භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි තැනට පැමිණුනා. පැමිණ භාග්‍යවතුන් වහන්සේට ආදරයෙන් වන්දනා කොට එකත්පස්ව වාඩි වුණා. එකත්පස්ව වාඩි වුණ ආයුෂ්මත් සමිද්ධි තෙරුන් භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැල කළා. "ස්වාමීනී, මාරයා, මාරයා යැයි කියනවා. ස්වාමීනී, මාරයා හෝ මාරයා යන පැණවීම හෝ ඇති වන්නේ කවර කරුණු මත ද ?"

**යත්ථ ඛෝ සමිද්ධි අත්ථි චක්ඛු, අත්ථි රූපා, අත්ථි චක්ඛුවිඤ්ඤාණං, අත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ මාරෝ වා මාරපඤ්ඤත්ති වා. ....(පෙ).... අත්ථි ජිව්හා, අත්ථි රසා, අත්ථි ජිව්හාවිඤ්ඤාණං, අත්ථි ජිව්හාවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ මාරෝ වා මාරපඤ්ඤත්ති වා. ....(පෙ).... අත්ථි මනෝ, අත්ථි ධම්මා, අත්ථි මනෝවිඤ්ඤාණං, අත්ථි මනෝවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ මාරෝ වා මාරපඤ්ඤත්ති වා.**

පින්වත් සමිද්ධි, යම් තැනක ඇස තිබේ නම්, රූප තිබේ නම්, ඇසේ විඤ්ඤාණය තිබේ නම්, ඇසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ තිබේ නම්, අන්න එතැන තමයි මාරයා සිටීම හෝ මාර පැණවීම තිබෙන්නේ ....(පෙ).... දිව තිබේ නම්, රස තිබේ නම්, දිවේ විඤ්ඤාණය තිබේ නම්, දිවේ විඤ්ඤාණයෙන් දත යුතු දේ තිබේ නම්, අන්න එතැන තමයි මාරයා සිටීම හෝ මාර පැණවීම තිබෙන්නේ ....(පෙ).... මනස තිබේ නම්, මනසට අරමුණු වන දේ තිබේ නම්, මනසේ විඤ්ඤාණය තිබේ නම්, මනසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ තිබේ නම්, අන්න එතැන තමයි මාරයා සිටීම හෝ මාර පැණවීම තිබෙන්නේ.

**යත්ථ ච ඛෝ සමිද්ධි නත්ථි චක්ඛු, නත්ථි රූපා, නත්ථි චක්ඛුවිඤ්ඤාණං, නත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ මාරෝ වා මාරපඤ්ඤත්ති වා. ....(පෙ).... නත්ථි ජිව්හා, නත්ථි රසා, නත්ථි ජිව්හාවිඤ්ඤාණං, නත්ථි ජිව්හාවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ මාරෝ වා මාරපඤ්ඤත්ති වා. ....(පෙ).... නත්ථි මනෝ, නත්ථි ධම්මා, නත්ථි මනෝවිඤ්ඤාණං, නත්ථි මනෝවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ මාරෝ වා මාරපඤ්ඤත්ති වාති.**

පින්වත් සමිද්ධි, යම් තැනක ඇස නැත්නම්, රූප නැත්නම්, ඇසේ විඤ්ඤාණය නැත්නම්, ඇසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ නැත්නම්, අන්න එතැන තමයි මාරයා නැති තැන හෝ මාර පැණවීම නොතිබෙන තැන ....(පෙ).... දිව නැත්නම්, රස නැත්නම්, දිවේ විඤ්ඤාණය නැත්නම්, දිවේ විඤ්ඤාණයෙන් දත යුතු දේ නැත්නම්, අන්න එතැන තමයි මාරයා නැති තැන හෝ මාර පැණවීම නොතිබෙන තැන ....(පෙ).... මනස නැත්නම්, මනසට අරමුණු වන දේ නැත්නම්, මනසේ විඤ්ඤාණය නැත්නම්, මනසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ නැත්නම්, අන්න එතැන තමයි මාරයා නැති තැන හෝ මාර පැණවීම නො තිබෙන තැන.

සංයුත්ත නිකාය >සළායතන වගර්ය >සළායතන සංයුත්තං >මිගජාල වගර්ය

## සමිද්ධි - දුක්ඛපඤ්හ සුත්තං

රජගහ නුවර දී ....

**දුක්ඛං දුක්ඛන්ති භන්තේ, වුච්චති. කිත්තාවතා නු ඛෝ භන්තේ, දුක්ඛං වා අස්ස දුක්ඛපඤ්ඤත්ති වාති?**

"ස්වාමීනි, දුක, දුක යැයි කියනවා. ස්වාමීනි, දුක හෝ දුක යන පැණවීම හෝ ඇති වන්නේ කවර කරුණු මත ද?"

**යත්ථ ඛෝ සමිද්ධි අත්ථි චක්ඛු, අත්ථි රූපා, අත්ථි චක්ඛුවිඤ්ඤාණං, අත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ දුක්ඛං වා දුක්ඛපඤ්ඤත්ති වා. ....(පෙ).... අත්ථි ජිව්හා, අත්ථි රසා ....(පෙ).... අත්ථි මනෝ, අත්ථි ධම්මා, අත්ථි මනෝවිඤ්ඤාණං, අත්ථි මනෝවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ දුක්ඛං වා දුක්ඛපඤ්ඤත්ති වා.**

පින්වත් සමිද්ධි, යම් තැනක ඇස තිබේ නම්, රූප තිබේ නම්, ඇසේ විඤ්ඤාණය තිබේ නම්, ඇසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ තිබේ නම්, අන්න එතැන තමයි දුක තිබීම හෝ දුක පැණවීම තිබෙන්නේ ....(පෙ).... දිව තිබේ නම්, රස තිබේ නම් ....(පෙ).... මනස තිබේ නම්, මනසට අරමුණු වන දේ තිබේ නම්, මනසේ විඤ්ඤාණය තිබේ නම්, මනසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ තිබේ නම්, අන්න එතැන තමයි දුක තිබීම හෝ දුක පැණවීම තිබෙන්නේ.

**යත්ථ ච ඛෝ සමිද්ධි නත්ථි චක්ඛු, නත්ථි රූපා, නත්ථි චක්ඛුවිඤ්ඤාණං, නත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ දුක්ඛං වා දුක්ඛපඤ්ඤත්ති වා. ....(පෙ).... නත්ථි ජිව්හා, නත්ථි රසා, ....(පෙ).... නත්ථි මනෝ, නත්ථි ධම්මා, නත්ථි මනෝවිඤ්ඤාණං, නත්ථි මනෝවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ දුක්ඛං වා දුක්ඛපඤ්ඤත්ති වාති.**

පින්වත් සමිද්ධි, යම් තැනක ඇස නැත්නම්, රූප නැත්නම්, ඇසේ විඤ්ඤාණය නැත්නම්, ඇසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ නැත්නම්, අන්න එතැන තමයි දුක නැති තැන හෝ දුක පැණවීම නොතිබෙන තැන ....(පෙ).... දිව නැත්නම්, රස නැත්නම් ....(පෙ).... මනස නැත්නම්, මනසට අරමුණු වන දේ නැත්නම්, මනසේ විඤ්ඤාණය නැත්නම්, මනසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ නැත්නම්, අන්න එතැන තමයි දුක නැති තැන හෝ දුක පැණවීම නො තිබෙන තැන.

සංයුත්ත නිකාය >සළායතන වග්ගය >සළායතන සංයුත්තං >මිගජාල වග්ගය

## සමිද්ධි - ලෝකපඤ්හ සුත්තං

රජගහ නුවර දී ....

**ලෝකෝ ලෝකෝති භන්තේ වුච්චති. කිත්තාවතා නු ඛෝ භන්තේ, ලෝකෝ වා අස්ස ලෝකපඤ්ඤත්ති වාති?**

"ස්වාමීනි, ලෝකය, ලෝකය යැයි කියනවා. ස්වාමීනි, ලෝකය හෝ ලෝකය යන පැණවීම හෝ ඇති වන්නේ කවර කරුණු මත ද?"

**යත්ථ ඛෝ සමිද්ධි, අත්ථි චක්ඛු, අත්ථි රූපා, අත්ථි චක්ඛුවිඤ්ඤාණං, අත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ ලෝකෝ වා ලෝකපඤ්ඤත්ති වා ....(පෙ).... අත්ථි ජිව්හා අත්ථි රසා ....(පෙ).... අත්ථි මනෝ අත්ථි ධම්මා අත්ථි මනෝවිඤ්ඤාණං අත්ථි මනෝවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ ලෝකෝ වා ලෝකපඤ්ඤත්ති වා.**

පින්වත් සමිද්ධි, යම් තැනක ඇස තිබේ නම්, රූප තිබේ නම්, ඇසේ විඤ්ඤාණය තිබේ නම්, ඇසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ තිබේ නම්, අන්න එතැන තමයි ලෝකය තිබීම හෝ ලෝක පැණවීම තිබෙන්නේ ....(පෙ).... දිව තිබේ නම්, රස තිබේ නම් ....(පෙ).... මනස තිබේ නම්, මනසට අරමුණු වන දේ තිබේ නම්, මනසේ විඤ්ඤාණය තිබේ

නම්, මනසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ තිබේ නම්, අන්න එතැන තමයි ලෝකය තිබීම හෝ ලෝක පැණවීම තිබෙන්නේ.

**යත්ථ ච ඛෝ සමිද්ධි නත්ථි චක්ඛු නත්ථි රූපා නත්ථි චක්ඛුවිඤ්ඤාණං නත්ථි චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ ලෝකෝ වා ලෝකපඤ්ඤත්ති වා ....(පෙ).... නත්ථි ජිව්හා නත්ථි රසා ....(පෙ).... නත්ථි මනෝ නත්ථි ධම්මා නත්ථි මනෝවිඤ්ඤාණං නත්ථි මනෝවිඤ්ඤාණවිඤ්ඤාතබ්බා ධම්මා, නත්ථි තත්ථ ලෝකෝ වා ලෝකපඤ්ඤත්ති වාති.**

පින්වත් සමිද්ධි, යම් තැනක ඇස නැත්නම්, රූප නැත්නම්, ඇසේ විඤ්ඤාණය නැත්නම්, ඇසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ නැත්නම්, අන්න එතැන තමයි ලෝකය නැති තැන හෝ ලෝක පැණවීම නොතිබෙන තැන ....(පෙ).... දිව නැත්නම්, රස නැත්නම් ....(පෙ).... මනස නැත්නම්, මනසට අරමුණු වන දේ නැත්නම්, මනසේ විඤ්ඤාණය නැත්නම්, මනසේ විඤ්ඤාණයෙන් දත යුතු දේ නැත්නම්, අන්න එතැන තමයි ලෝකය නැති තැන හෝ ලෝක පැණවීම නො තිබෙන තැන.

සංයුත්ත නිකාය >නිදාන වගර්ය >අභිසමය සංයුත්තං >ගහපති වගර්ය

## දුක්ඛ සුත්තං

සැවැත් නුවරදී ...............

**දුක්ඛස්ස භික්ඛවේ සමුදයඤ්ච අත්ථංගමඤ්ච දේසිස්සාමි. තං සුණාථ ....(පෙ).... කතමෝ ච භික්ඛවේ දුක්ඛස්ස සමුදයෝ? චක්ඛුඤ්ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සංගති ඵස්සෝ. ඵස්සපච්චයා වේදනා. වේදනාපච්චයා තණ්හා. අයං ඛෝ භික්ඛවේ දුක්ඛස්ස සමුදයෝ.**

“පින්වත් මහණෙනි, දුකේ හටගැනීම ගැනත්, දුකේ නැතිවීම ගැනත් මා ඔබට දේශනා කරන්නම්. එය හොඳින් අසා ගන්න. ....(පෙ)....පින්වත් මහණෙනි, දුකේ හටගැනීම කියන්නේ මොකක්ද? ඇසත්, රූපත් හේතු කොට ගෙන ඇසේ විඤ්ඤාණය උපදිනවා. ඒ තුනේ එකතු වීම ස්පශර්යයි. ස්පශර්ය හේතු කොට ගෙන විඳීම ඇති වේ. විඳීම හේතු කොට ගෙන තණ්හාව ඇති වේ. පින්වත් මහණෙනි, දුකේ හටගැනීම කියන්නේ මේකටයි.

**ජිව්හඤ්ච පටිච්ච රසේ ච ....(පෙ).... කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බේ ච ....(පෙ).... මනඤ්ච පටිච්ච ධම්මේ ච උප්පජ්ජති මනෝවිඤ්ඤාණං. තිණ්ණං සංගති ඵස්සෝ. ඵස්සපච්චයා වේදනා. වේදනාපච්චයා තණ්හා. අයං ඛෝ භික්ඛවේ දුක්ඛස්ස සමුදයෝ.**

කනත්, ශබ්දයත් හේතු කොට ගෙන ....(පෙ).... නාසයත්, ගඳ සුවඳත් හේතු කොට ගෙන ....(පෙ).... දිවත්, රසයත් හේතු කොට ගෙන ....(පෙ).... කයත්, පහසත් හේතු කොට ගෙන ....(පෙ).... මනසත්, අරමුණුත් හේතු කොට ගෙන මනසේ විඤ්ඤාණය උපදිනවා. ඒ තුනේ එකතු වීම ස්පශර්යයි. ස්පශර්ය හේතු කොට ගෙන විඳීම ඇති වේ. විඳීම හේතු කොට ගෙන තණ්හාව ඇති වේ. පින්වත් මහණෙනි, දුකේ හටගැනීම කියන්නේ මේකටයි.

**කතමෝ ච භික්ඛවේ දුක්ඛස්ස අත්ථංගමෝ? චක්ඛුඤ්ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සංගති ඵස්සෝ. ඵස්සපච්චයා වේදනා. වේදනාපච්චයා තණ්හා. තස්සායේව තණ්හාය අසේසවිරාගනිරෝධා උපාදානනිරෝධෝ. උපාදානනිරෝධා භවනිරෝධෝ. භවනිරෝධා ජාතිනිරෝධෝ. ජාතිනිරෝධා ජරාමරණං සෝකපරිදේවදුක්ඛදෝමනස්සුපායාසා නිරුජ්ඣන්ති. ඒවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරෝධෝ හෝති. අයං ඛෝ භික්ඛවේ දුක්ඛස්ස අත්ථංගමෝ.**

පින්වත් මහණෙනි, දුකේ නැතිවීම කියන්නේ මොකක්ද? ඇසත්, රූපත් හේතු කොට ගෙන ඇසේ විඤ්ඤාණය උපදිනවා. ඒ තුනේ එකතු වීම ස්පර්ශයයි. ස්පර්ශය හේතු කොට ගෙන විඳීම ඇති වේ. විඳීම හේතු කොට ගෙන තණ්හාව ඇති වේ. ඒ තණ්හාව සහමුලින්ම නොඇල්මෙන් නිරුද්ධ වීමෙන් උපාදාන නිරුද්ධ වෙලා යනවා. උපාදාන නිරුද්ධ වීමෙන් භවය නිරුද්ධ වෙලා යනවා. භවය නිරුද්ධ වීමෙන් ඉපදීමෙන් ඉපදීම නිරුද්ධ වෙලා යනවා. ඉපදීම නිරුද්ධ වීමෙන් ජරා මරණ, සෝක, වැළපීම්, කායික දුක්, මානසික දුක්, සුසුම් හෙළීම් නිරුද්ධ වෙලා යනවා. ඔය ආකාරයටයි මේ මුළු මහත් දුක් රැසම නිරුද්ධ වෙලා යන්නේ. පින්වත් මහණෙනි, දුකේ නැතිවීම කියන්නේ මේකටයි.

**සෝතඤ්ච පටිච්ච සද්දේ ච උප්පජ්ජති සෝතවිඤ්ඤාණං ....(පෙ).... ඝානඤ්ච පටිච්ච ගන්ධේ ච උප්පජ්ජති ඝාන විඤ්ඤාණං ....(පෙ).... ජිව්හඤ්ච පටිච්ච රසේ ච ....(පෙ).... කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බේ ච ....(පෙ).... මනඤ්ච පටිච්ච ධම්මේ ච උප්පජ්ජති මනෝවිඤ්ඤාණං. තිණ්ණං සංගති ඵස්සෝ. ඵස්සපච්චයා වේදනා. වේදනා පච්චයා තණ්හා. තස්සායේව තණ්හාය අසේසවිරාගනිරෝධා උපාදානනිරෝධෝ. උපාදානනිරෝධා භවනිරෝධෝ. භවනිරෝධා ජාතිනිරෝධෝ. ජාතිනිරෝධා ජරාමරණං සෝකපරිදේවදුක්ඛදෝමනස්සුපායාසා නිරුජ්ඣන්ති. ඒවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරෝධෝ හෝති. අයං ඛෝ භික්ඛවේ දුක්ඛස්ස අත්ථංගමෝ’ති.**

කනත්, ශබ්දයත් හේතු කොට ගෙන ....(පෙ).... නාසයත්, ගඳ සුවඳත් හේතු කොට ගෙන ....(පෙ).... දිවත්, රසයත් හේතු කොට ගෙන ....(පෙ).... කයත්, පහසත් හේතු කොට ගෙන ....(පෙ).... මනසත්, අරමුණුත් හේතු කොට ගෙන මනසේ විඤ්ඤාණය උපදිනවා. ඒ තුනේ එකතු වීම ස්පර්ශයයි. ස්පර්ශය හේතු කොට ගෙන විඳීම ඇති වේ. විඳීම හේතු කොට ගෙන තණ්හාව ඇති වේ. ඒ තණ්හාව සහමුලින්ම නොඇල්මෙන් නිරුද්ධ වීමෙන් උපාදාන නිරුද්ධ වෙලා යනවා. උපාදාන නිරුද්ධ වීමෙන් භවය නිරුද්ධ වෙලා යනවා. භවය නිරුද්ධ වීමෙන් ඉපදීමෙන් ඉපදීම නිරුද්ධ වෙලා යනවා. ඉපදීම නිරුද්ධ වීමෙන් ජරා මරණ, සෝක, වැළපීම්, කායික දුක්, මානසික දුක්, සුසුම් හෙළීම් නිරුද්ධ වෙලා යනවා. ඔය ආකාරයටයි මේ මුළු මහත් දුක් රැසම නිරුද්ධ වෙලා යන්නේ. පින්වත් මහණෙනි, දුකේ නැතිවීම කියන්නේ මේකටයි.

සංයුත්ත නිකාය >ඛන්ධක වගර්ය >ඔක්කන්ති සංයුත්තං >චක්ඛු වගර්ය

## චක්ඛු සුත්තං

302. සැවැත් නුවර දී .....................

**චක්ඛුං භික්ඛවේ, අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී. සෝතං අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී. ඝානං අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී. ජිව්හා අනිච්චා විපරිණාමී අඤ්ඤථාභාවී කායෝ අනිච්චෝ විපරිණාමී අඤ්ඤථාභාවී. මනෝ අනිච්චෝ විපරිණාමී අඤ්ඤථාභාවී.**

පින්වත් මහණෙනි, ඇස යනු අනිත්‍ය දෙයක්. වෙනස් වන දෙයක්. අන්‍ය ස්වභාවයකට පත්වෙන දෙයක්. කණ යනු අනිත්‍ය දෙයක්. වෙනස් වන දෙයක්. අන්‍ය ස්වභාවයකට පත්වෙන දෙයක්. නාසය යනු අනිත්‍ය දෙයක්. වෙනස් වන දෙයක්. අන්‍ය ස්වභාවයකට පත්වෙන දෙයක්. දිව යනු අනිත්‍ය දෙයක්. වෙනස් වන දෙයක්. අන්‍ය ස්වභාවයකට පත්වෙන දෙයක්. කය යනු අනිත්‍ය දෙයක්. වෙනස් වන දෙයක්. අන්‍ය ස්වභාවයකට පත්වෙන දෙයක්. මනස යනු අනිත්‍ය දෙයක්. වෙනස් වන දෙයක්. අන්‍ය ස්වභාවයකට පත්වෙන දෙයක්.

**යෝ භික්ඛවේ, ඉමේ ධම්මේ ඒවං සද්දහති අධිමුච්චති, අයං වුච්චති සද්ධානුසාරී, ඔක්කන්තෝ සම්මත්තනියාමං, සප්පුරිසභූමිං ඔක්කන්තෝ, වීතිවත්තෝ පුථුජ්ජනභූමිං. අභබ්බෝ තං කම්මං කාතුං, යං කම්මං කත්වා නිරයං වා**

**තිරච්ඡානයෝනිං වා පෙත්තිවිසයං වා උපපජ්ජෙය්‍ය. අභබ්බෝ ච තාව කාලං කාතුං යාව න සෝතාපත්තිඵලං සච්ඡිකරෝති.**

පින්වත් මහණෙනි, යම් කෙනෙක් මේ ධර්මයන් ඔය ආකාරයෙන් අදහා ගනී නම්, ශ්‍රද්ධාවෙහි බැසගනී නම්, මොහුට කියන්නේ සද්ධානුසාරී කෙනා කියලයි. නිවන් මගට බැසගත් කෙනා කියලයි. සත්පුරුෂ භූමියට බැසගත් කෙනා කියලයි. පෘථග්ජන භූමිය ඉක්මවා ගිය කෙනා කියලයි. යම් කමර්යක් කරලා නිරයේ හෝ තිරිසන් යෝනියේ හෝ ප්‍රේතලෝකයේ හෝ උපදිනවා නම් එබඳු කමර්යක් කරන්නට ඔහුට පුළුවන්කමක් නෑ. යම්තාක් සෝවාන් ඵලය සාක්ෂාත් කරන්නේ නැත්නම් ඒතාක් ම (සෝවාන් වන තුරු) ඔහුට කළුරිය කරන්නට පුළුවන්කමකුත් නෑ.

**යස්ස ඛෝ භික්ඛවේ, ඉමේ ධම්මා ඒවං පඤ්ඤාය මත්තසෝ නිජ්ඣානං ඛමන්ති, අයං වුච්චති ධම්මානුසාරී, ඔක්කන්තෝ සම්මත්තනියාමං, සප්පුරිසභූමිං ඔක්කන්තෝ, වීතිවත්තෝ පුථුජ්ජනභූමිං. අභබ්බෝ තං කම්මං කාතුං, යං කම්මං කත්වා නිරයං වා තිරච්ඡානයෝනිං වා පෙත්තිවිසයං වා උපපජ්ජෙය්‍ය. අභබ්බෝ ච තාව කාලං කාතුං යාව න සෝතාපත්තිඵලං සච්ඡිකරෝති.**

පින්වත් මහණෙනි, යමෙකුට මේ ධමර්යන් ඔය ආකාරයෙන් ප්‍රඥාව තුළින් ප්‍රමාණවත් පරිදි අවබෝධයක් තිබෙනවා නම්, මොහුට කියන්නේ ධම්මානුසාරී කෙනා කියලයි. නිවන් මගට බැසගත් කෙනා කියලයි. සත්පුරුෂ භූමියට බැසගත් කෙනා කියලයි. පෘථග්ජන භූමිය ඉක්මවා ගිය කෙනා කියලයි. යම් කමර්යක් කරලා නිරයේ හෝ තිරිසන් යෝනියේ හෝ ප්‍රේත ලෝකයේ හෝ උපදිනවා නම් එබඳු කමර්යක් කරන්නට ඔහුට පුළුවන්කමක් නෑ. යම්තාක් සෝවාන් ඵලය සාක්ෂාත් කරන්නේ නැත්නම් ඒතාක් ම (සෝවාන් වන තුරු) ඔහුට කළුරිය කරන්නට පුළුවන්කමකුත් නෑ.

**යෝ භික්ඛවේ, ඉමේ ධම්මේ ඒවං ජානාති ඒවං පස්සති, අයං වුච්චති සෝතාපන්නෝ අවිනිපාතධම්මෝ නියතෝ සම්බෝධිපරායනෝති.**

පින්වත් මහණෙනි, යම් කෙනෙක් මේ ධමර්යන් ඔය ආකාරයෙන් අවබෝධ කරනවා නම්, ඔය ආකාරයෙන් දකිනවා නම්, මොහුට කියන්නේ සෝවාන් කෙනා කියලයි. අපායෙහි නොවැටෙන ස්වභාවයෙන් යුතු නියත වශයෙන් ම ඒ අමා නිවන පිහිට කොට සිටින කෙනා කියලයි.